## කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2016/2017

### PSC 3150 - සමාජ විද්‍යා පර්යේෂණ විධික්‍රම සහ ප්‍රවේශ

පැ දෙකයි (02)

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

1. (අ) "දේශපාලනය" යන්න සාකච්ඡා කරන්න.

   (ආ) පහත කාටූනය ප්‍රසිද්ධ කාටූන් ශිල්පී අවන්ත ආටිගලගේ වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලද්දකි. ඊට ඔහු යොදා තිබූ මාතෘකාව වුයේ ***ජයන්ති කුරුඋතුම්පලා එවරස්ට් තරණය කළ ප්‍රථම ශ්‍රී ලාංකිකයා බවට පත්වේ*** යන්නයි. දේශපාලන විද්‍යා සිසුවකු වශයෙන් මේ කාටූනය තුළින් ප්‍රකාශ වන දේශපාලනය පිළිබඳ ව සාකච්ඡා කරන්න.




2. දේශපාලන විද්‍යා පර්යේෂණවලට **විද්‍යාවේ දර්ශනය** (philosophy of science), පර්යේෂණ ප්‍රවේශ (research approaches) සහ පර්යේෂණ විධික්‍රමය (research methodology) යන ත්‍රිත්වයෙහි වැදගත්කම පහදන්න.

( අ. පි. බ. )

3. (අ) ප්‍රමාණාත්මක (quantitative) සහ ගුණාත්මක (qualitative) පර්යේෂණ විධික්‍රමවල වෙනස්කම් ඒවායේ පහත ගුණාංග ආශ්‍රයෙන් සසඳන්න:
   (i) ඥාන මීමංසා (epistemologies)
   (ii) අරමුණු
   (iii) පර්යේෂකයාගේ භූමිකාව

   (ආ) සමහරුන්ට අනුව මිශ්‍ර විධික්‍රමය (mixed methods) සමාජ විද්‍යා පර්යේෂණවලට වඩාත් සුදුසුය. මේ පිළිබඳ ඔබේ මතය පහදන්න.

4. පහත ප්‍රවේශ අතරින් **දෙකක් (02)** තෝරාගෙන එම ප්‍රවේශ දේශපාලන විද්‍යා පර්යේෂණ කෙරෙහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න:
   (අ) ආයතනික ප්‍රවේශය (Institutional approach)
   (ආ) මාක්ස්වාදී ප්‍රවේශය (Marxist approach)
   (ඇ) තාර්කික වරණ ප්‍රවේශය (Rational choice approach)
   (ඈ) ස්ත්‍රීවාදී ප්‍රවේශය (Feminist approach)

5. ලංකාවේ කාන්තාව බිම් මට්ටමේ **සාංගමික සමාජ ජීවිතයට** (associational life) සක්‍රියව දායක වුවත් දේශපාලනය තුළ ඇගේ නියෝජනය බෙහෙවින් අඩු ය. මේ ප්‍රහේලිකාව අධ්‍යයනය කිරීමට ඔබ යෝජනා කරන ඊට වඩාත් සුදුසු ප්‍රවේශය කුමක් ද? අනෙක් ප්‍රවේශවලට වඩා එම ප්‍රවේශය මේ පර්යේෂණයට වඩාත් සුදුසු වීමට හේතුව ලෙස ඔබ දකින්නේ කුමක් ද?

6. (අ) සාම්ප්‍රදායික චර්යාවාදී ප්‍රවේශයේ (classical behavioural approach) සත්තාවේදී (ontological) සහ ඥාන මීමංසාත්මක (epistemological) ස්ථාවරයන් සාකච්ඡා කරන්න.

   (ආ) පශ්චාත් චර්යාවාදී ප්‍රවේශය (post-behavioural approach) සාම්ප්‍රදායික චර්යාවාදී ප්‍රවේශයෙන් වෙනස් වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් දක්වන්න.

   (ඇ) චර්යාවාදී ප්‍රවේශය තුළින් හැදෑරිය හැකි දේශපාලන විද්‍යා පර්යේෂණ ප්‍රශ්නයක් සාකච්ඡා කරන්න.

7. (අ) දේශපාලන විද්‍යා පර්යේෂණවල යොදාගන්නා අර්ථකථනාත්මක ප්‍රවේශය (interpretive approach) සමාජ ප්‍රපංචවල විශ්වාස, අදහස් සහ කතිකාවන් (beliefs, ideas and discourses)මත පදනම් වූවකි. උදාහරණ සහිත ව පහදන්න.

   (ආ) අර්ථකථනාත්මක ප්‍රවේශයේ සත්තාවේදී සහ ඥාන මීමංසාත්මක ස්ථාවරයන් සාකච්ඡා කරන්න.

*******************************